# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1701/4 - 2011 අප්‍රේල් 11 වැනි සඳුදා - 2011.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ, පළාත් සභාවේ 2011 අංක 02 දරන

ඌව පළාතේ, පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2011 පෙබරවාරි මස 24 වන දින සම්මත කරන ලදුව 2011 මාර්තු 01 වන දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන,<br>
පළාත් සභා ලේකම්,<br>
ඌව පළාත් සභාව.

2011 වර්ෂයේ අප්‍රේල් මස 01 වැනි දින,<br>
බදුල්ල රජ වීදියේ පිහිටි<br>
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දීය.

2011 අංක 2 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය

අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තිය

ඌව පළාත තුළ පිහිටුවා ඇති පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීම සඳහා වූ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහ ඊට අදාළ හෝ අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය 252 වන අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 277(1), 277(1අ), 277(1ආ), 277(2)(ආ), 277(3), 255 අධිකාරය වන නගර ආඥාපනතේ 184 වගන්තියට හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තියට අනනුකූල වූවකි.

1A - PG 001233—335 (2011/04)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. මේ ප්‍රඥප්තිය "ඌව පළාතේ පළාත් සභාවේ, 2011 අංක 2 දරන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ 2011 අංක 2 දරන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට එය ක්‍රියාත්මක වන්නේය.

අකාර්යක්ෂමතාව මත පළාත් පාලන ආයතන විසුරුවා හැරීමට අමාත්‍යවරයා සතු බලය

2.(1) යම් පළාත් පාලන ආයතනයක් හෝ යම් පළාත් පාලන ආයතනයක යම් සාමාජිකයෙකු හෝ යම් පළාත් පාලන ආයතනයක විධායක ප්‍රධානියා
හෝ විසින්

(අ) අකාර්යක්ෂම ලෙස සහ අයථා ලෙස පාලනය ගෙන ගොස් ඇති බවට:හෝ

(ආ) අදාළ නීතිය, නියෝග, රෙගුලාසි, ප්‍රඥප්ති හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පවරා ඇති කාර්යය ඉටු කිරීම පැහැර හැර ඇති බවට, හෝ

(ඇ) නීතියේ හෝ ප්‍රඥප්තිවල යම් විධිවිධානයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර හෝ නොසලකා හැර ඇති බවට : හෝ

(ඈ) අදාළ නීතිය, නියෝග, රෙගුලාසි, ප්‍රඥප්ති හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පවරා ඇති බලතල අයථා ලෙස ක්‍රියාත්මක කොට ඇති බව, හෝ

(ඉ) රැස්වීම් පැවැත්වීම හෝ රැස්වීම්වලට පැමිණීම හෝ ඒ රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීම හෝ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම දිගින් දිගටම පැහැර ඇති බවට:

(ඊ) ක්‍රියාත්මකව පවතින ස්ථාවර කමිටු/කාරක සභා සඳහා සාමාජිකත්වය දරමින් දිගින් දිගටම සහභාගිවීම පැහැර ඇති බවට:

ඌව පළාතේ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා සෑහීමට පත්වන කවර අවස්ථාවක වුව දී, ඒ එක් එක් අවස්ථාවට අනුකූලව අවශ්‍ය වන පරිදි, අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මගින් -

(i) ඒ පළාත් පාලන ආයතනයේ විධායක ප්‍රධානියා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය, නැතහොත්

(ii) ඒ පළාත් පාලන ආයතනයේ සියළුම සාමාජිකයන් හෝ සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය, නැතහොත්

(iii) ඒ පළාත් පාලන ආයතනය විසුරුවා හැරිය හැකිය.

එවැනි නියමයක් හැකිතාක් ඉක්මනින් පළාත් සභාව වෙත තැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් (1) (i) හෝ (ii) හෝ (iii) වන අනු වගන්ති යටතේ නියමයක් කිරීමට පෙර, එකී (1) වන උප වගන්තියේ (අ) සිට (ඊ) දක්වා අනු වගන්තිවල සඳහන් කරුණු සම්බන්ධයෙන් තමා සෑහීමට පත්වීම සඳහා: එකී කරුණු ගැන පරීක්ෂා කර මාස තුනක් ඇතුළත දී ඒ පිළිබඳ වාර්තාවක් සැපයීමට, විශ්‍රාමික විනිසුරුවරයෙකු පත් කළ යුතු ය. එසේ පත් කරනු ලැබූ තැනැත්තාට, ඒ පරීක්ෂණය සම්බන්ධයෙන්, පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරනු ලැබූ කොමසාරිස්වරයෙකු සතු බලතල ඇත්තේය.

(3)(අ) "යම් කරුණක් පිළිබඳව (2) උප වගන්තිය යටතේ පරීක්ෂණයක් කිරීමට විශ්‍රාමලත් විනිශ්චයකරුවකු පත්කිරීමට පෙරාතුව හෝ (2) වන උප වගන්තිය යටතේ පරීක්ෂණයක් පැවතෙද්දී ක්‍රියාවලිය නැවැත්වීමක් වශයෙන් විශ්‍රාමික අධිකරණ නිලධාරියා විසින් සිදු කරනු ලබන පරීක්ෂණයට හෝ වාර්තා කිරීමට යටත්ව අමාත්‍යවරයා විසින්"

(i) ඒ පළාත් පාලන ආයතනයේ විධායක ප්‍රධානියාගේ වැඩ අත්හිටුවිය හැකි අතර, ඔහුගේ ධූරයේ කටයුතු කිරීමට අවස්ථාවෝචිත පරිදි, ඒ පළාත් පාලන ආයතනය නියෝජ්‍ය නගරාධිපතිවරයාට හෝ උප සභාපතිවරයාට විධාන කළ යුතු අතර, ඒ පළාත් පාලන ආයතනයේ නියෝජ්‍ය

නගරාධිපතිවරයාගේ නැතහොත් උප සභාපතිවරයාගේ ධූරය පුරප්පාඩු වී හෝ ඒ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ හෝ උප සභාපතිවරයාගේ වැඩ අත්හිටුවා ඇති අවස්ථාවක දී, යට කී විධායක ප්‍රධානියාගේ බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්යය ඉටු කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ තත් ප්‍රදේශයේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාට විධාන කළ යුතු ය. නැතහොත්,

(ii) ඒ පළාත් පාලන ආයතනයේ යම් සභිකයෙකුගේ ධූරය අත්හිටුවිය හැකිය. නැතහොත්, -

(iii) ඒ පළාත් පාලන ආයතනයේ කටයුතු අත්හිටුවිය හැකි අතර, ඒ පළාත් පාලන ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්ය ඉටු කිරීමට තත් ප්‍රදේශයේ සහකාර පළාත් පාලන කොමසාරිස් වරයාට හෝ අමාත්‍යවරයා තීරණය කරනු ලබන පළාත් රාජ්‍ය සේවයට යටත් මාණ්ඩලික ශ්‍රේණියේ වෙනත් නිලධාරියෙකු, ප්‍රාදේශීය පරිපාලනයේ සේවයෙහි නියුතු වෙනත් රාජ්‍ය නිලධරයෙකු වෙත විධාන කළ හැකිය.

(3)(ආ) මේ වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තාගේ වාර්තාව තමා වෙත ලැබුණු විට, අමාත්‍යවරයා විසින්, මේ වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ නියමයක් කිරීම හෝ මේ උප වගන්තියේ (අ) ඡේදය යටතේ කරනු ලැබූ නියමයන් අවලංගු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

(4) විසුරුවා හරිනු ලැබූ මහ නගර සභාව වෙනුවට, මහ නගර සභා ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව අළුත් මහ නගර සභාවක් සංස්ථාපනය කරන ලෙසත්, විසුරුවා හරිනු ලැබූ නගර සභාව වෙනුවට නගර සභා ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව අළුත් නගර සභාවක් සංස්ථාපනය කරන ලෙසත්, විසුරුවා හරිනු ලැබූ ප්‍රාදේශීය සභාව වෙනුවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානයන්ට අනුකූලව අළුත් ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කරන ලෙසත්, ඉහත සඳහන් ආකාරයටම පළ කරනු ලබන තදනන්තර නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිවේදනය කරනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් 3(1) උප වගන්තිය යටතේ වූ නියමයන් මගින් ප්‍රාදේශීය සභාවක් හෝ නගර සභාවක් විසුරුවා හරිනු ලබන අවස්ථාවක ඔහු විසින් එම නියමයන් හෝ තදනන්තර නියමයකින්:

ප්‍රාදේශීය සභාවේ හෝ නගර සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා සහ ඒ කාර්ය සඳහා, නියමයේ නිශ්චිතව දක්වනු ලබන කොන්දේසි හෝ සීමා කිරීම්වලට යටත්ව, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ප්‍රාදේශීය සභාවක හෝ නගර සභා ආඥා පනත යටතේ නගර සභාවක බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම සඳහා නියමිත කාල සීමාවකට හෝ කලින් කලට හෝ විශේෂ කොමසාරිස්වරයෙකු හෝ කොමසාරිස්වරයන් හෝ පත් කරනු ලැබිය යුතු ය.

තව ද,

(6) (5) වන උප වගන්තිය යටතේ, අමාත්‍යවරයා විසින් යම් විශේෂ කොමසාරිස්වරයෙකු හෝ කොමසාරිස්වරයන් හෝ පත් කරනු ලබන අවස්ථාවක ප්‍රාදේශීය සභාව හෝ නගර සභාව වෙත සතු කරනලද සියළු දේපළ සහ ගිවිසුම් යටතේ ඇති හිමිකම් සහ සියළු බලතල එම විශේෂ කොමසාරිස්වරයා හෝ කොමසාරිස්වරයන් වෙත සතු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද, නියමයෙහි ප්‍රකාශිත කාලසීමාවේ අවසානය දක්වා හෝ අමාත්‍යවරයා විසින් අන්‍යාකාරයකින් විධාන කරනු ලබන තෙක් හෝ ප්‍රාදේශීය සභාවේ හෝ නගර සභාවේ සියළු වගකීම් සහ කාර්ය එම විශේෂ කොමසාරිස්වරයා හෝ කොමසාරිස්වරයන් වෙත පවරනු ලැබිය යුතු අතර, ඔහු හෝ ඔවුන් විසින් ඒවා ඉටු කරනු ලැබිය යුතු ය.

(7) ප්‍රාදේශීය සභාවක හෝ නගර සභාවක කටයුතු පරිපාලනය විශේෂ කොමසාරිස්වරයෙකු හෝ කොමසාරිස්වරුන් විසින් අවසන් කිරීමෙන් පසු ඒ ප්‍රාදේශීය සභා හෝ නගර සභා ප්‍රදේශය සඳහා අළුත් ප්‍රාදේශීය සභාවක් හෝ නගර සභාවක් සංස්ථාපනය කළ අවස්ථාවක, ඒ අළුත් ප්‍රාදේශීය සභාව හෝ නගර සභාව, අවස්ථාවෝචිත පරිදි, ඒ විශේෂ කොමසාරිස්වරයාගේ හෝ කොමසාරිස්වරුන්ගේ අනුප්‍රාප්තිකයා විය යුතුය.

(8)(අ) අමාත්‍යවරයා විසින් (1) උප වගන්තිය යටතේ නියමයන් මගින් පළාත් පාලන ආයතනයක විධායක ප්‍රධානියකු හෝ අවස්ථාවෝචිත පරිදි වෙනත් සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කරනු ලැබූ කවර අවස්ථාවක වුව ද ඔහුගේ සභිකත්වය ඒ සමඟම අවසන් වන්නේය.

(8)(අ) අමාත්‍යවරයා විසින් (1) උප වගන්තිය යටතේ කරනු ලබන නියමයන් මගින් ධූරයෙන් ඉවත් කරනු ලබන පළාත් පාලන ආයතනයක විධායක ප්‍රධානියකු, සාමාජිකයෙකු හෝ සියළුම සාමාජිකයන් ධූරයෙන් ඉවත් කරනු ලබන දින සිට වසර පහක් දක්වා කාල සීමාවකට එම පළාත් පාලන ආයතනය සඳහා නැවත සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගැනීමට සුදුස්සෙකු නොවිය යුතුය.

(9) අමාත්‍යවරයා විසින් (1) වන උප වගන්තිය යටතේ වූ නියමයන් මඟින් පළාත් පාලන ආයතනයක විධායක ප්‍රධානියා, සාමාජිකයෙකු හෝ සියළුම සාමාජිකයන් ධූරයෙන් ඉවත් කරනු ලැබ, එසේ ඉවත් කරන ලද විධායක ප්‍රධානියා, වෙනත් සාමාජිකයෙක් හෝ සාමාජිකයන් වෙනුවට, අළුත් විධායක ප්‍රධානියෙකු. සාමාජිකයෙකු හෝ සාමාජිකයන් තෝරා පත් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ අළුත් විධායක ප්‍රධානියා, සාමාජිකයෙකු හෝ සාමාජිකයන් කලින් ධූරයෙන් ඉවත් කිරීමක් සිදු කරනු නොලබන්නේ නම්, ඉතිරි ධූර කාලය සඳහා ධූරය දැරිය යුතුය.

(10) මේ වගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයකම, ඒ නියමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන විධාන ඇතුළත් විය යුතු අතර, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට, ප්‍රඥප්තියක බලය ඊට ඇත්තේය.

අර්ථ නිරූපනය.

(11) මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ''අමාත්‍යවරයා'' යන්නෙන් ඌව පළාතේ ''පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයෙහි පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා ද, පළාත් සභාව විසුරුවා හැරි විටකදී ඌව පළාත් ආණ්ඩුකාරවරයාද,'' ''පළාත් පාලන ආයතනය'' යන්නෙන්, ඌව පළාත තුළ ක්‍රියාත්මක වන යම් ''මහ නගර සභාවක්'' ''නගර සභාවක්''හෝ ''ප්‍රාදේශීය සභාවක් ''අදහස් වේ. ''විධායක ප්‍රධානියා'' යන්නෙන්, ''මහ නගර සභාවක නගරාධිපතිවරයා හෝ නගර සභාවක නැතහොත් ප්‍රාදේශීය සභාවක ''සභාපතිවරයා''අදහස් වේ. සාමාජිකයා යන්නෙන් මහ නගර සභාවක උප නගරාධිපති හා සභිකවරුන් ද නගර සභාවක, ප්‍රාදේශීය සභාවක උප සභාපති හා සභිකවරුන් ද අදහස් වෙයි. ''අදාළ නීතිය''යන්නෙන්, මහ නගර සභා ආඥා පනත හෝ නගර සභා ආඥා පනත හෝ ප්‍රාදේශීය සභා පනත අවස්ථාවෝචිත පරිදි අදාළ වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

(12) මේ ප්‍රඥප්තියේ සිංහල, සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

04-709

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.